**සති පාසල - සබරගමුව පළාත**

නිවිතිගල අධ්‍යාපන කලාපය

භූගෝල විද්‍යාව - 9 ශ්‍රේණිය - 2021 - තෙවන වාරය

## පරිසර තුලිතතාව

❖ **මෙම සතිය තුළ නියමිත පාඩම් වලින් ලබාගත යුතු ඉගෙනුම් පල**

- පාරිසරික තුලිතතාව අර්ථකථනය කරයි.
- පාරිසරික තුලිතතාව පවත්වා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- පාරිසරික තුලිතතාව බිඳ වැටීමට හේතු විස්තර කරයි.
- පාරිසරික අසංතුලනය නිසා ඇති වන අහිතකර ප්‍රතිවිපාක විමර්ශනය කරයි.
- පරිසර ආචාර ධර්ම පිළිපැදීමෙන් තිරසර සංවර්ධනයට මඟ පෑදෙන බව ක්‍රියාකාරකම් ඇසුරෙන් අවධාරණය කරයි.

### පැවරුම් 1

අප අවට පරිසරය නිර්මාණය වී ඇත්තේ ජීවී හා අජීවී සංරචක වල එකතුවෙන් එකම පද්ධතියක් ලෙසිනි. මෙම සංරචක එකිනෙක අතර අන්‍යෝන්‍ය සබඳතා පවත්වයි. එමෙන්ම හරහා ගොඩනැගී ඇති පරිසර සමබරතාව හෙවත් තුලිතතාවය හා එයට වන බලපෑම් පිළිබඳවත් සඳහන් ඔබගේ පෙළපොතෙහි ඇති පාඩම් ඒකකය අධ්‍යයනයකොට මෙම පැවරුම්වල යෙදෙන්න.

1. පරිසරය යන්න නිර්වචනය කරන්න.

2. පහත දැක්වෙන වචන උපයෝගී කරගනිමින් ලබාදී ඇති සටහනේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

**සූර්ය ශක්තිය / ජලය / සතුන් / වාතය / පස / ශාක / භූරූප / මිනිසා / පාෂාණ / ඛනිජ**

පරිසරයේ සංරචක

| ජීවී සංරචක | අජීවී සංරචක |
|---|---|
| ★ .................................. | ★ .................................. |
| ★ .................................. | ★ .................................. |
| ★ .................................. | ★ .................................. |
| ★ .................................. | ★ .................................. |
| ★ .................................. | ★ .................................. |

3. ජෛව ප්‍රජාව යනු කවුරුන්ද?

4. පාරිසරික සමතුලිතතාව යන්න අර්ථ දක්වන්න.

5. මිනිසා භෞතික පරිසරය විවිධාකාරී ලෙස පරිහරණය කරන අවස්ථා තුනක් නම් කරන්න.

❖ **මෙම ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගත හැකි මූලාශ්‍ර**

පෙළ පොතේ පිටු අංක 75 - 82

මිහිතලයේ භෞතික පරිසරය, එච්. කේ. එන්. කරුණාරත්න.

http://www.cea.lk/

https://www.youtube.com/watch?v=Vk5Nv_KajqY

https://www.youtube.com/watch?v=bMQBUYuxvwY

https://www.youtube.com/watch?v=oxtMFmDTv3Q

*සැකසුම - ඉසුරු බණ්ඩාර, නිවිතිගල අධ්‍යාපන කලාපය, දොලොස්වලකන්ද විද්‍යාලය*